





"මේ ලොව
ලස්සන ම අහස ඇත්තේ
ගමට ඉහළිනි
අම්මා
නිදන තැන
ඇයගේ සොහොනට උඩිනි"

සංකල්පයක්! මව් බිමේ වෙසෙන ප්‍රවීණතම කිවියරයාණන්ගේ කවි සිතුවිල්ලක්. හෙළ ගී රචනා කලාවේ අර්ථාන්විත නිබන්ධන රැසක් බිහි කළ ප්‍රවීණ ගී පද රචකයෙකුගේ සිතට දැණුන හැඟීමක්. රත්න ශ්‍රී විජේසිංහයන්ගේ සංකල්පනාව මේ.

# ලස්සන ම අහස



උඳුවප් මාසයේ මෙල්බන් නුවර "ලස්සන අහස" නමින් නොමිළයේ පැවැත්වීමට සංවිධානය වන රත්න ශ්‍රී විජේසිංහ ගී පද රචනා විමර්ශන සැදෑව වෙනුවෙන් මෙවර අපගේ ගී සඳැළුවට ඇරයුම් ලබන්නේ එතුමායි. තමන්ගේ ඇස නිර්මාණ ඇතුළත් පොත්පත් ඇසුරින්, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය තුළින් හරවත් යමක් විඳීමේ පිපාසයෙන් පෙළෙන රසික, ප්‍රේක්ෂකයන් සනහාලන රත්න ශ්‍රී විජේසිංහයන්ගේ හඬ දුරකතනය තුළින් ඇසීමට ලැබීම පවා වාසනාවකි.

"ලක්බිම පත්තරෙන් කරුපු එක සාකච්ඡාවකදී මගේන ඇහුවා මා දැකලා තියෙන ලස්සන ම තැන තියෙන්නේ කොහෙද කියලා. ඒකට දුන්න පිළිතුර තමයි මේ විදියට විහිදිලා ගියේ. මා ලියූ තීරු ලිපි අතර ඔය නිසදැස් කවිය ගැන දිගට ලියවුණා. මගේ "තරු ලකුණ" කියන පොතට ඒ ලිපිය ඇතුළත් වුණා. ඒ වගේම "ලස්සන ම අහස සහ මතක සිතුවිලි" කියලා පොතකුත් පිටවුණා."

සැබැවින් ම යම් නිර්මාණයක් ඉපදීමට නිමිත්තක් වෙයි. මෙවන් දාර්ශනිකත්වය කැටිවුණ සංකල්පයක් සිතෙහි ජනිත වීමට විජේසිංහයන් ව සංවේදී කළේ කුමන ආකාරයේ අත්දැකීමක් ද?

"අපට ඉහළින් තියෙන අහස එක එක වෙලාවට, එක එක තැනට, එක එක අයට, එක එක විදියට පේනවා. නමුත් ඒ අතරින් තමන් වඩාත් ම ප්‍රිය කරන අහස දකින්නට ලැබුණේ කොහෙ ද කියලා කෙනෙකුගෙන් ඇහුවොත්?

"මගේ මව අපි අතරින් වියෝවුණේ මට වයස අවුරුද්දයි දවස් විසි දෙකකින්. ඉතින් මට මගේ අම්මාව මතක නෑ. මම අම්මාව අදටත් දකින්නේ, හඳුනා ගන්නේ, මගේ දෙමව්පියන්ගේ මංගල පින්තූරයෙන් විතරයි"

"මගේ දෙමව්පියන් විවාහ වෙනකොට අම්මාගේ වයස අවුරුදු දහසයයිලු. ඒ නිසා මම අදටත් මංගල පින්තූරයෙන් --- වයස අවුරුදු දාසයක මගේ අම්මාවයි. මේ කාරණය නිමිති කරගෙන මට ලියැවුණ " සොළොස් හැවිරිදි අම්මා" කියලා කවි පෙළක්. ඒක මගේ "සන්ධ්‍යා තීර්ථය" පොතට ඇතුළත් කළා."

තමන්ගේ මව්ටත්, ගම් පියසටත් මෙතරම් පෙම් බැඳි කවියෙකු ගී පද නිබන්ධකයෙකු විදේශගත වීමෙන් මොනයම් ආකාරයේ අත්දැකීමක්ක විඳියිද?

"ඒකට මම කැමතියි. මොනම විදිහේ අත්දැකීමක් වුණත් නිර්මාණවලට වැදගත් වෙනවා. අත්දැකීම් ඕන කරන්නෙ නිර්මාණ වර්ණවත් කරන්නනෙ. දැන් බලන්න මගේ මීට කලින් කළ විදේශ සංචාර දෙකක ලබපු අත්දැකීම්;"

"කියුබාවේ හන්දියක් ගානේ බෝ ගස් තියෙනවා. ඒ ගස් දැක්කම මට හරි සතුටක් දැනුණා. ලංකාවේදී නම් අපි වඳිනවා, පුදනවා, සරසනවා, වතාවක් කරනවා. ඒත් කියුබාවේ කවුරුවත් ඒ බෝ ගස් ගණන් ගන්නේවත් නෑ. ඉතින් මට ලියවුණ "භවානා බෝධිය" කියලා කවි පෙළක්. ඒක "සන්ධ්‍යා තීර්ථය" පොතටත් ඇතුලත් කළා."

"ඔය වගේම තවත් අත්දැකීමක් තමයි ප්‍රංශයේ චාල්ස් ඩිගෝල් ගුවන් තොටුපලේ දී ලැබුණේ. වායුසමනය කරලා තිබුණ ඒ පර්යන්තය ඇතුලට ගේ කුරුල්ලෙක් ආවා. අපේ ගෙදර බිත්තියේ එල්ලලා තියෙන මුට්ටියේ ඉන්න ගේ කුරුල්ලෙක්!"

රත්න ශ්‍රී විජේසිංහයන්ගේ ඒ අත්දැකීමට සමානව අප මෙහ විඳිනා දෙයකි. මයිනන්ගේ දර්ශනය සහ හඬ හිරු පායන දිනයකත්, වැසි දිනයකත් මයිනන් ගායනා හඬෙහි වෙනස මව් බිමේ සේමයි. මයින කුරුල්ලන්ගේ හඬ ඇසෙනා කල නිරතුරුවම අපගේ සිතට

මව්බිමේ ඒ පරිසරය කැන්දයි
ඒ මනෝභාවයන් අපට නංවයි.

"ඒ ගුවන් තොටුපළ පර්යන්තයේදීම දැණුන තවත් දෙය් මතක් වුණා..." විජේසිංහයන් නැවත හඬ අවදි කරයි.

ඉන්දියානු පවුලක් ඇමෙරිකාවට යන්න ඇවිත් හිටියා. ඒ මව දරුවනට තමන් අරගෙන ආව කෑම බෙදා දුන්නා. ඇය මාව දැකලා "කම් මයි ඩියර් :ඤපෘ පහ ා්ර* කියලා මටත් කෑම කන්න ආරාධනා කළා. ඒ අපේ ගමේ ඉන්න අපේ මවකගේ විදිය. දරුවන් දහයක් දොළහකට හරි කන්න දීලා පිට කෙනෙක් ආවොත් ඒ අයටත් කෑම දීලා තමයි තමන් කන්නේ. ඒ ආසියාතික මවකගේ ගුණය නේද? කියුබාව මොනතරම් සමාජවාදී රටක් වුණත් දිව ගිලෙන්න ආවත් වතුර පොදක් දෙන්න කෙනෙක් නෑ."

"ඉතින් ඔය වාගේ සමාජ අත්දැකීම් නිර්මාණකරුවෙකුට හරි වැදගත්. ඒක තමන්ගේ ගමට රටට විතරක් සීමා වෙන්නේ නෑ."

"අනික් දේ තමයි ලංකාවේ ඉන්න රසිකයින්ට ප්‍රේක්ෂකියන්න තරම් අවස්ථාවල් දුර බැහැර විදේශගතවෙලා ඉන්න අපේ අයට ලැබෙන්නේ නෑ. පහුගිය සැප්තැම්බර් පළවෙනිදා ඉඳන් මේ වෙනකොට (ඔක්තෝබර් 25) මම මේ රටේ විවිධ පළාත්වල දේශන 31කට සහභාගී වෙලා තියෙනවා. මෙහේ ඉන්න හරවත් යමක් විඳින රසිකයින්ගේ ආරාධනා පිට සංවිධානය කෙරුණ දේශනයි ඒ. ඒත් ඒ වගේ අවස්ථාවල් විදේශයක ඉන්න අපේ අයට ලැබෙන්නේ අඩුවෙන්."

"මෙල්බන්වල අපේ අය විශාල පිරිසක් ඉන්නවා ය කියන එකත්, බොහොම දෙනෙක් කලාවට හිතවත් බවත් මම අහලා තියෙනවා. ඉතින් කවියට ගීතයට ආදරය කරන ලොකු පිරිසක් හමුවීම හරිම සතුටක්. මගේ නිර්මාණ ගැන ඒ අය සමඟ කතා කරන්න ලැබීමත් ඒ වගේම සතුටක්. ඒත් ඒ මගේ දේ වර්ණනා කර ගන්න නම් නෙවෙයි. අර කලින් කිව්වා වගේ නිර්මාණකරුවෙකුගේ අත්දැකීම් මොන විදියට ද නිර්මාණ ය පාදක වෙන්නේ කියන එක ඒ අය එක්ක බෙදා හදා ගන්න විතරයි නිර්මාණයක් රසිකයින් හට පිදූ පසු ඒ පිළිබඳව කතාකිරීමට ඒ නිර්මාණකරුවාට අයිතියක් නැති බවටත්, එය රසිකයින් හෝ විචාරකයින් අතින් සිදුවිය යුත්තක් බවටත් මතයක් වෙයි. එහෙත් සද්භාවයෙන් කෙරෙනා සදය විචේචන වෙනුවට නිර්දය විචේචන පමණක් ඉතිරිව ඇති වකවානුවක නිර්මාණය පිළිබඳව නිවැරදි යමක් දැන ගැනීමේ පිපාසයෙන් පෙළෙනා, රසිකයිනට සිදුවන්නේ අසාධාරණයකි. ප්‍රවීණයින්ට පූර්වාදර්ශී කරගන්නා ආධුනිකයින්ටද යහපත් යමක් නොලැබෙනු ඇත. එනයින් නිර්මාණකරුවාට ම සිය නිර්මාණ පිළිබඳව කතිකාවතක් ගොඩ නංවා ගැනීමට අද සිදුවී තිබේ.

"ඇත්තට ම මා අදහන කලාවට, ඒ වගේ ම නිර්මාණවලට මේ ඕස්ට්‍රේලියානු සංචාරය බලපායි කියලා මම හිතනවා. ඒ වගේ ම රට තොට බලා ගැනීමට අවස්ථාව ලැබෙන එකත් ලොකු දෙයක් නේ. ඉතින් බොහොම සුන්දර දවස් කීපයක් ඒ කාලයේ ගතවේවි කියලා හිතනවා. සුන්දර විදියට වගේ ම අර්ථවත් විදියටත් මේ කටයුතු සිද්ධ වේවි. මේ සද්කාර්යයට උරදෙන නිරාෂ ගුණසේකර, සුමින්ද නානායක්කාර, දිලිනි ඊරියවල කියන මගේ රසිකයින්ටත් ස්තුතිවන්ත වෙනවා."

රත්න ශ්‍රී විජේසිංහ ප්‍රවීණ කිවිවරයාණන් සැමට ම ස්තුතිවන්ත වෙමින් පිළිසඳර නිමා කළේය.

මෙල්බන්හි සිට මෙවන් සොඳුරු සැඳෑවක් රසිකයින් වෙනුවෙන් නොමිලයේ ම පිදීමට සැරසෙන ඒ රසිකයින් තිදෙනා වෙනුවෙන් අපි නිරාෂ කවියා දුරකථනයෙන් සම්බන්ධ කර ගත්තෙමු.

"මගේ නිර්මාණ ජීවිතයට මහත් අත්වැලක් වූ, සුමින්දත්, දිලිනිත් ඉතා ආදරය කරන කලාකරුවෙකු වූ රත්න ශ්‍රී විජේසිංහයන් ව අපි මෙහි ගෙන්වාගන්න හිතුවේ එතුමාට අපේ තියෙන කෘතවේදී බව දක්වන්න. ඒත් මේ වගේ අගනා සම්පතක් මේ රටට ආවා ම ඒ දැණුම අපතේ නොයන අනික් හැමෝම එක්ක බෙදා හදාගන්න ඕන කියන අවංක සිතුවිල්ලෙන්මයි අපි "ලස්සන ම අහස" ගී විමර්ශනාත්මක වැඩ සටහන නොමිලයේම ඉදිරිපත් කිරීමට සංවිධානය කරන්නේ. අපිට කිසිම මූල්‍යමය පරමාර්ථයක් නැති නිසායි අපි අතින් වියදම් කරගෙන නොමිලයේ මේ කටයුත්ත කරන්න හිතුවේ."

"මේ රටට ගායන ශිල්පීන් ඇවිත් ඔවුන්ගේ ගි ප්‍රසංග ඕන තරම් පවත්වලා යනවා. ඒත් ඒ ගීතවල සැබෑ නිර්මාණකරුවන්, අයිතිකරුවන් හඳුන්වා දීමත් අපේ යුතුකමක්..."

**මේ උත්සවයේ විශේෂ දේශනයක් ජයතිලක කම්මැල්ලවීර කියන සම්මානලාභී ප්‍රවීණ ලේඛකයා පවත්වනවා. වැඩ සටහන ඉදිරිපත් කරන්නේ මෙහේ අපි අතර ඉන්න ලේඛකයෙකු වගේම කවියෙකු වන ජගත් ජේ. එදිරිසිංහයි. ඒ වගේම ඇතැම් ගීත සඳහා අමා නර්තනායතනයක්, විශ්ව රංගායතනයත් නර්තනාංග ඉදිරිපත් කරනවා. මේ හැම දෙයක් ම අපට ඒඅ ය කරලා දෙන්නේ නොමිලයේ. ඒ රත්න ශ්‍රී විජේසිංහයන්ට ගරු කිරි මක්, කෘතවේදීත්වය පළ කිරීමක් විදියටයි.**

"ඉතින් හරවත් කවි අහන කියවන රසික, පාඨක, ප්‍රේක්ෂක හැමෝටම මේ නො මිළයේ පවත්වන උත්සවයට සහභාගී වෙන්න කියලා අපි ඉතා සෙනෙහසින් ආරාධනය කරනවා."

අපි නිරාෂ ගුණසේකර තරුණ කවියාට ස්තුතිවන්ත වෙමින් සුබ පැතුවෙමු. දෙසැම්බර් මස 20 වන සෙනසුරාදා සවස 5.30 ට කීස්බරෝහි, අයිසැක් රෝඩ් හි අංක 28 දරණ ස්ථානයේ පිහිටි "වැන්ඩිලර් කොමියුනිටි සෙන්ටර්" ශාලාවේ පැවැත්වෙන මෙම අවස්ථාව ගී රස විඳිනා සියළුම රසිකයින්ට මහඟු අවස්ථාවක් වනු ඇත.

රත්න ශ්‍රී විජේසිංහයන්ගේ "ලස්සනම අහස" පද පෙළින් මෙවර "ගී සඳැළුව" අරුත් ගැන්වෙයි.

**පොසොන් මාසයේ**
**ශුක්ල පක්ෂයේ**
**තුදුස්වක සඳේ මුහුණින්**
**තුරුපත් අගින් සෙරී ගලන්නේ**
**අම්මාගේ ආදරයයි.**

**මේලොව සුන්දර ම**
**අහස ඇත්තේ ගමට ඉහළිනි.**
**අම්මා නිදන තැන**
**ඇගේ සොහොනට උඩිනි.**

**රත්න ශ්‍රී විජේසිංහ**




## මොණරාගල ජනකවි

**කුරක්කන් කපන වාරෙත් ආපි ළමා**
**ඉනේ තියෙන වත ඇදගන් දෙපොට නමා**
**කනේ තිබෙන කොළ මැදපන් දියෙන් තෙමා**
**වට පිට නොබලන්න නුඹෙ අත කැපෙයි ළමා**

**නෙරිය එන්ඩ එතු සේලේ ඇදගන් හදියේ**
**ඉස පීරා ගෙඩි මාලේ බැදගන් හදියේ**
**මල් කොතලෙයි පන් කැත්තයි අරගන් හදියේ**
**කිරි කුරහන් කපා ගන්ට යමකෝ හදියේ**

**ගල් ගල් කුරක්කන් කැපුවේ පුතු ගෙ ගෙට**
**මල් මල් කුරක්කන් කැපුවේ මගේ ගෙට**
**මල් කරලද කිරි පෙව්වේ පුත නුඹට**
**ඔන්න පුතේ මල් පෙට්ටිය පුටුව උඩ**

## තල මල ගැන ලියැවුණ මොණරාගල ජන කවි

**ගල් කැඩුමට මහපාරත් යස සුද්දා**
**දිය නෑමට අඹගහ ළිඳ සුවි සුද්දා**
**මල් පිපුමට ටැම්ගොඩ පංසල සුද්දා**
**යල් කුඹුරට පිපි තල මල පරසිද්දා**

**අහසකි උසකි උස පමණෙකි රන් කොතකී**
**මූදකි රැළකි රැළ පිට යන තල ගේකී**
**දේස දේස වල කියනා සන්නයෙකී**
**මෙවැනි ආකාර අම්මේ තල මලකී**